## පරිනත කවියකුගේ හෘදය සාක්ෂිය

# මෛත්‍රී පනාගොඩ ගේ "හද මුමුණන හඬ"



සරසවි ප්‍රකාශනයක්
කංචුකය අතුල කල්දෙමුල්ල

**ජගත් ජේ එදිරිසිංහ**

**කවිය වූකලී කවියාගේ අධ්‍යාත්මය මිස අනෙකක් නොවේ" මහගම සේකර රාජතිලක ලයනල් සහ ප්‍රියන්ත**

**"මට කවිය යනු හෙළන්නට බැරි වූ කඳුළක පිට කර ගන්නට නොහැකි**



**වූ සුසුමක වෙන කිසිදු අයුරකින් කියා ගත නුහුණු සෞන්දර්යය සංවේදනයක ප්‍රකාශන මාධ්‍යයයි" මාලතී කල්පනා ඇම්බ්‍රෝස් මේ නිහඬ වෙරළට එන්න**

පුරෝගාමී කවියා මහගම සේකරත් නූතන පරපුරේ කිවිඳිය මාලතී කල්පනාත් මගේ මතක යට එන්නේ විප්‍රවාසී කවියකුගේ සංවේදනා කවි බසට පෙරලුණ කවි පොතක් අතට ගත් විට ය. විප්‍රවාසයත් පොදුවේ ජීවිතයත් කවියකුගේ සිතේ ඇති කරන කම්පනය කවි බසින් ලියා තැබූ මේ කවියා මෛත්‍රී පනාගොඩ ය. ඔහුගේ කවි පොත " හද මුමුණන හඬ" ය.

මෛත්‍රී මානවවාදී කවියකු යයි පිළිගැනීමට පාත්‍රවන්නේ මේ කවි පොතේ එන නිර්මාණ නිසාම නොවේ. ඔහු වරින් වර අප හමුවට විවිධ ස්වරූප වලින් ඉදිරිපත් කර ඇති කලා නිර්මාණ තුළ ගැබ්ව ඇති මානව දයා වේ ගුණ සුවඳ රසිකයෝ හඳුණති.

පාවී පාවී මේ එන්නේ අතීතයේ සිට එන සුළඟයි
ඈත අතීතේ අසිපත් සිපගෙන අතීතයේ සිට එන සුළඟයි

යනුවෙන් කේමදාස සූරීන් සහ ටී එම් ජයරත්න සූරීන් සමග එක්ව සදා නොමියන

## පොත් පත් පුවත්

ගීයක් අප හමුවේ තැබූ මෛත්‍රී පනාගොඩ නම් වන අපූර්ව නිර්මාණක රුවා සිය නොසන්සිඳුණ නිර්මාණාවේශය අපට පෙන්වා දෙන්නේ සිය නවතම කාවය සංග්‍රහය සමගින් ය.

විප්‍රවාසය සමගින් තවත් එවැනි කටුක ජීවන අත්දැකීම් රැසක් විඳගත් පරිණත කවියකු ඒ සංවේදනා නිර්මාණ බවට පෙරළුෑ කදිම අවස්ථාවක් ලෙස "හද මුමුණන හඬ" හඳුන් වාදෙන්නට මම කැමැත්තෙමි. අනපේක්ෂිත හුදකලාව විසින් ජනිත කරනු ලැබූ කවියාගේ නිර්මාණාවේශය මේ මොරගාන්නේ හෘදය සාක්ෂිය ම නොවේද?

ඈත සරු ගොවි බිමේ වඩ කරන ජනතාව
මෑත කම්හල් අතර වෙහෙසෙ වන ජනතාව
පාර තොට අතරමග මුණ ගැසෙන ජනතාව
සානුකම්පිත සිතින් මාව සිහි කරාවිද?
**(හද මුමුණන හඬ )**

ඒ අවබෝධය තුළ ම කවියා අනාගතය දෙස සුබවාදී බැල්මක් හෙළන්නටද උත්සාහ කරන බවක් අපට පෙනී යන්නේ මෙසේ ය.

හිරි කැඩෙන අත්ල මත පන්හිඳක් රඳවන්න
ඔබගෙ තුටු සිනා දුක් තැවුල් සටහන් කරමි
සහෝදර සෙනෙහසින් වෙලී අපි ඇවිද යමු
කැලෑ මල් සිනාසෙන අනාගත ලෝකයට
**(පුනරුත්පත්තිය)**

ලෝකය ඉතා සීඝ්‍රයෙන් වෙනස් වෙමින් තිබේ. වසර තිහ හතළිහක කාලයක් තුල සිදුව ඇති පරිවර්තනය සමස්ථ ලෝකය ගෙනගොස් ඇත්තේ කොතැනකට ද? එවන් ලෝකයක නිර්මාණකරුවකුට සිය ආස්ථානය එක ලෙස රැකගෙන සිටිය හැකිවේද යන පැනය වරෙක නැගෙයි.

අතළොස්සක් සිටුවරුන්ට
සැප සම්පත් වගා වෙන්න

24 වන පිටට

දශක 6 ක් තිස්සේ රසික ඔබ අප පිනවූ
සිංහල චිත්‍රකතා වංශ කතාවේ මහ සිත්තරා



අභිනන්දන උළෙල

2018 ජනවාරි 31 බ්‍රහස්පතින්දා සවස 4.30 ට
කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී
විද්වත් කථිකයින්, සුමිතුරන්, සුවහසක් රසික සහෘදයින් පිරිවරා
ඔහුට කෘත ගුණ පුද කෙරෙන, ඒ සොඳුරු සන්ධ්‍යාවට සහභාගි වන්නට,
සහෘද ඔබටත් කෙරෙන කාරුණික ආරාධනය යි මේ...

ඒ වෙනුවෙන් ඔස්ට්‍රේලියා වාසී අපේ යුතුකම ඉටුකරමු.
ඔබට මේ වෙනුවෙන් දායක විය හැකි ආකාරය පිළිබඳව අපට කියන්න.,

මෙල්බර්න්
ජගත් 0433 438535
සිසිර 0400 123610
තේජා 0430 449600
ශ්‍රීනාත් 0401 400081
සිඩ්නි
අනුර 0422 328902